# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

| | | |
|---|---|---|
| දිනය | : | 2019.01.24 |
| වේලාව | : | පෙ.ව. 9.00 |
| ස්ථානය | : | ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත. |

## සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය :

| | | | |
|---|---|---|---|
| **1)** | **ප්‍රදීප් යසරත්න මහතා** | **-** | **ප්‍රධාන ලේකම් (බ.ප)** |
| **2)** | **පී.සෝමසිරි මහතා** | **-** | **ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය (බ.ප)** |
| **3)** | **එම්.ජී.ඒ.තිලකරත්න මහතා** | **-** | **ලේකම්,රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප)** |
| **4)** | **හේමන්ත සමරකෝන් මහතා** | **-** | **සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය (බ.ප)** |
| **5)** | **එච්.ජී.ජී.ජේ.ධර්මසේන මහතා** | **-** | **ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප)** |
| **6)** | **ඩබ්ලිව්.එම්.දයාවතී මිය** | **-** | **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)** |
| **7)** | **සිරිසෝම ලොකුවිතාන මහතා** | **-** | **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)** |
| **8)** | **එන්.බන්දුල ප්‍රේමකුමාර මහතා** | **-** | **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)** |
| **9)** | **ඩී.එම්.එන්.දිසානායක මිය** | **-** | **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)** |
| **10)** | **ඔවිනි කේ. විජේවික්‍රම මිය** | **-** | **ජ්‍යෙ. සහ. ලේකම් (පළාත් පාලන අමාත්‍යාංශය-බ.ප)** |
| **11)** | **කේ.ඩී.වයි.බිමාලි මිය** | **-** | **සහකාර ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)** |
| **12)** | **පේෂලාආර්. අබේසූරියමිය** | **-** | **සහකාර ප්‍රධාන ලේකම් (පාලන)** |
| **13)** | **කේ.එන්.සූරියආරච්චි මිය** | **-** | **සහකාර ප්‍රධාන ලේකම් (පාලන)** |
| **14)** | **ආර්.එම්.ඩී.පී.කුමාරිමිය** | **-** | **සහකාරලේකම්(ප්‍රවාහනඅමාත්‍යාංශය-බ.ප)** |
| **15)** | **ලසිතා දේවගේ මිය** | **-** | **සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)** |
| **16)** | **එච්.ඒ.වයි.ලක්ෂ්මි මිය** | **-** | **ගණකාධිකාරී (අධ්‍යාපන අමාත්‍යාංශය-බ.ප)** |
| **17)** | **කේ.ශමිලා මනෝරි මිය** | **-** | **ගණකාධිකාරී (කෘෂිකර්ම අමාත්‍යාංශය-බ.ප)** |

**ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේ දී ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධව පහත දක්වා ඇති තීරණයන්ටඑළඹෙන ලදී.**

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | පළාත් සභා නව ගොඩනැගිල්ලේ ස්ථාපිත සියලු ආයතන සඳහා කාර්යාලයීය උපකරණ මිලදී ගැනීම සම්බන්ධව | භාණ්ඩ මිලදී ගැනීම සම්බන්ධ ප්‍රගතිය ප්‍රධාන ලේකම් විමසන ලදී.<br>• සභා ලේකම්- කාර්යාලයීය උපකරණ ඇණවුම් කර ඇති බවත්, සභා ශාලාවට භාණ්ඩ මිල දී ගෙන නොමැති බවත්, පුටු සඳහා කාරක සභාව එකඟ වී ඇති බවත්, පවසන ලදී. එසේම, රූපවාහිනී යන්ත්‍ර අවශ්‍ය නොවන බවත් දන්වන ලදී.<br>• සෞඛ්‍ය අමාත්‍යාංශය - අවශ්‍ය භාණ්ඩ සියල්ල ඇණවුම් කර ඇති බවත්, මාසයක් ඇතුළත සියලු උපකරණ ලැබීමට නියමිත බවත්, පවසන ලදී.<br>• ප්‍රවාහන අමාත්‍යාංශය - අවශ්‍ය භාණ්ඩ සියල්ල ඇණවුම් කර ඇති බවත් මාසයක්ඇතුළත සියලු උපකරණ ලැබීමට නියමිත බවත්, පවසන ලදී.<br>• පළාත් පාලන අමාත්‍යාංශය - අවශ්‍ය භාණ්ඩ සියල්ල ඇණවුම් කර ඇති බවත් පෙබරවාරි මාසය තුලසියලු උපකරණ ලැබීමට නියමිත බවත්, පවසන ලදී.<br>• කෘෂිකර්ම අමාත්‍යාංශය - රු. මිලි.07න් මිලි.02ක් වියදම් කර ඇති අතර, ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඇතිබවත්, පවසන ලදී.<br>• කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - අවශ්‍ය භාණ්ඩ වලින් කොටසක් ඇණවුම් කර ඇති බව ගණකාධිකාරී (කෘෂිකර්ම දෙපා.) විසින් ප්‍රධාන ලේකම් දැනුවත් කළ අතර, ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවේ නම්, සතියක් ඇතුළත අවශ්‍යප්‍රතිපාදන ප්‍රමාණයඉල්ලා එවන ලෙස ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී.<br>• අධ්‍යාපන අමාත්‍යාංශය - අවශ්‍ය භාණ්ඩ සියල්ල ඇණවුම් කර ඇති බැවින්, පෙබරවාරි 28 දින වන විට භාණ්ඩ ලැබීමට නියමිත බව දන්වන ලදී.<br>• ප්‍රධාන ලේකම් කාර්යාලය - ආපන ශාලාව සඳහා අවශ්‍ය මේස, පුටු මිල දී ගෙන ඇති බවත්,විදුරු 20ක් ලැබීමට නියමිතය.<br>විධායක සහ සාකච්ඡා මේස පෙබරවාරි මස අවසන් වන විට ලැබීමට නියමිත අතර, කාර්යාලයීය පුටු මාර්තු මස අවසන් වන විට ලැබීමට නියමිතය.<br><br>නව පළාත් සභා ගොඩනැගිල්ලේ ස්ථාපිත සියලු ආයතන සඳහා අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම 2019 මාර්තු මස අවසන් වන විට අනිවාර්යයෙන් සිදු කළ යුතු බවත්, සියලු ආයතන පරික්ෂාවට පැමිණෙන බැවින්, ඒ සඳහා සූදානම් වන ලෙසත්, ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 02. | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේබෙදා වෙන් කිරීම් (Partition) සම්බන්ධව | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීම සඳහා පළමු අදියරේ කටයුතු අවසන් බවත්, Partition කිරීමට ඉල්ලා ඇති බවත්, නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් දන්වන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |

| | | | |
|---|---|---|---|
| 03. | Audio Conference System ගිණුම් කාරක සභාවේ සවිකිරීම සම්බන්ධව | ශබ්ධ විකාශන පද්ධති (Audio Conference System) එකක 112ක් සභා පර්යන්තයේ සවි කර ඇති අතර, ඉතිරි ප්‍රමාණය ගිණුම් කාරක සභාවේ කටයුතු සඳහා උපයෝගී කර ගැනීමට සවි කිරීම සඳහා තීරණය කරන ලදී. ඒ අනුව, ඉදිරි කටයුතු සිදු කිරීමටනි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) වෙත දන්වන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 04. | බස්නාහිරපළාත් සභාවේ වෙබ් අඩවි සම්බන්ධව පවතින අඩුපාඩු | “බස්නාහිර පළාත් සභාවේ හොඳම වෙබ්අඩවිය තේරීමේ තරඟය - 2018” ප්‍රතිඵල ලැබී ඇති බවත්, ලබනමස මුල් සතිය වන විට ත්‍යාග ප්‍රදානය කිරීමට බලාපොරොත්තු වන බවත්, ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී.<br>නමුත්, වෙබ් අඩවිවල තත්ත්වය සම්බන්ධයෙන් තවමත් සෑහීමකට පත් විය නොහැකි බැවින්, එම වෙබ්අඩවි සම්බන්ධයෙන් නැවත සමාලෝචනයක් සිදු කිරීමට කටයුතු සුදානම් කරන ලෙස නි.ප්‍ර.ලේ.(පාලන) වෙත දන්වන ලදී.<br><br>සංචාරක මණ්ඩලයේ වෙබ්අඩවිය කඩිනමින් සකස් කර අවසන් කිරීමට උපදෙස් ලබා දෙන මෙන් පළාත් පාලන ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් වෙත උපදෙස් ලබා දෙන ලදී.<br><br>2019 වර්ෂය සඳහා ද බස්නාහිර පළාතේ හොඳම වෙබ් අඩවිය තේරීමේ තරඟාවලියක් පවත්වන බව ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය. |
| 05. | පළාත් සභා නව ගොඩනැගිලි සංකීර්ණයේ ගිනි ආරක්ෂක පුහුණුවසම්බන්ධව | 2019.01.25 දින පැවැත්වීමට නියමිත ගිනි ආරක්ෂක පුහුණු වැඩසටහනසඳහාපළාත් සභා ගොඩනැගිලි පරිශ්‍රයේ සියලු නිලධාරීන්ගේ සහය ලබා දෙන මෙන් ප්‍රධාන ලේකම් විසින් ඉල්ලා සිටින ලදී.<br><br>FireAssemblePoint සලකුණු කිරීම කඩිනමින් අවසන් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) වෙත දන්වන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 06. | බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ ආපන ශාලාව ආරම්භ කිරීම | ආපන ශාලාව සම්බන්ධවබස්නාහිර පළාත් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයේ අධ්‍යක්ෂ විසින් යොමු කරන ලද ශක්‍යතා වාර්තාව අධ්‍යනය කර ඉදිරිපත් කරන ලද කමිටු නිර්දේශ ඇතුළත් වාර්තාව සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇති බවත්, පෙබරවාරි මස අවසන් වන විට ආපන ශාලාව ආරම්භ කළ හැකි බව ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)<br><br>අධ්‍යක්ෂ, බ.ප ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය |

**<u>නව යෝජනා</u>**

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | 2018 වර්ෂයේ ප්‍රාග්ධන වැය ශීර්ෂයන් සම්බන්ධ ඉහලමුල්‍ය ප්‍රගතියපෙන්වීමසම්බන්ධයෙන් | 2018 වර්ෂයේ ප්‍රාග්ධන වැය ශීර්ෂයන් සම්බන්ධ ඉහලමුල්‍ය ප්‍රගතියක් පෙන්වීම සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් සියලු නිලධාරීන් හට ප්‍රශංසා කරන ලදී. මේ පිළිබඳව බස්නාහිර පළාත් සභාවේ දසභාගතකිරීමට කටයුතු කරන බවත්, මෙම ප්‍රගතිය ළඟා කර ගැනීමට දායක වූ නිලධාරීන්ගේ නාම ලේඛනය, ප්‍රශංසා ලිපි නිකුත් කිරීම සඳහා සතියක් තුල ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කරන ලෙසත්, අමාත්‍යාංශ ලේකම්වරුන්ටහා ප්‍රධාන ලේකම් කාර්යාලයේ නිලධාරීන්ගේ තොරතුරු ඒ ඒ අංශ වලින් ලබාගෙන ඉදිරිපත් කිරීම සඳහා නි.ප්‍ර.ලේ.(පාලන) වෙත දන්වන ලදී.<br><br>එසේම, බස්නාහිර පළාත් සභාවේ සමස්ත ප්‍රගතිය 95.93% ලෙස ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 02. | නව ගොඩනැගිල්ලේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතනවල නිලධාරීන්ගේ දරුවන්කාර්යාල වෙත රැගෙන ඒම | නව ගොඩනැගිල්ලේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතනවල නිලධාරීන්ගේ දරුවන්කාර්යාල වෙත රැගෙන ඒම හැකිතාක් දුරට පාලනය කර ගන්නා ලෙසත්, අත්‍යාවශ්‍යාමඅවස්ථාවක දී හැර දරුවන් රැගෙන නොඑන ලෙසටත්, කාර්යාලයට රැගෙන ඒමෙන් පසු යම් අනතුරක් සිදු වුවහොත් වගකීම භාර නොගන්නා බවට තම කාර්ය මණ්ඩලය දැනුවත් කරන ලෙසටත්, ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br><br>ගොඩනැගිල්ල වෙත පැමිණෙන මහජනතාවගේ කුඩා දරුවන් ඔවුන් අසලම තබා ගන්නා ලෙසට උපදෙස් ලබා දීම සඳහා ආරක්ෂක අංශය දැනුවත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 03. | "නව ගොඩනැගිල්ලේ අනවසර දැන්වීම් ප්‍රදර්ශනය" මැයෙන් ඉංජිනේරු-මුලස්ථාන, ඒ.තලංගම මහතා විසින් යොමු කරන ලද ලිපිය | ගොඩනැගිල්ලේ ස්ථාපිත ආයතන සඳහා අවශ්‍ය දැන්වීම් පුවරු 2019.02.15 දිනට පෙර සවි කර අවසන් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 04. | පළාත් සභා ගොඩනැගිල්ලේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති නවතම පරිගණක වැඩසටහන් 04 සම්බන්ධව | පළාත් සභා ගොඩනැගිල්ලේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති නවතම පරිගණක වැඩසටහන් 04 පිළිබඳව නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් ප්‍රධාන ලේකම් දැනුවත් කරන ලදී.<br><br>• Project Management Software - සැලසුම් අංශය මුලික කර ගෙන ක්‍රියාත්මක වේ.<br>• Assets Management System - මුල්‍ය අංශය මුලික කර ගෙන ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සම්බන්ධව සිදු කෙරේ.<br>• Complaint Management System<br>• Document Management System - ඉංජිනේරු අංශයෙන් මුලික අදියර ආරම්භ වේ. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |

| | | | |
|---|---|---|---|
| 05. | ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේදෙපාර්තමේන්තුවේ ලිපි ලේඛන පරිගණකගත කිරීම සම්බන්ධව | ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේදෙපාර්තමේන්තුවේ ලිපි ලේඛන පරිගණකගත කිරීම සම්බන්ධ යෝජනාව ඊළඟ අමාත්‍ය මණ්ඩල රැස්වීම සඳහා ඉදිරිපත් කරනලෙසත්, ව්‍යාපෘතිය අප්‍රේල් මස වන විට අවසන් කරන ලෙසත්, ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී. | ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය |
| 06. | බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක 03 පාදක කරගෙන Drive Throw බලපත්‍ර ලබා ගැනීමේ ස්ථාන පිහිටුවීම | බස්නාහිරපළාත්මෝටර් රථ දෙපාර්තමේන්තුවේ Drive Throw බලපත්‍ර ලබා ගැනීමේ ස්ථාන 03ක් බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක 03 පාදක කරගෙනමංසන්ධි03ක ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට පළාත්මෝටර් රථ කොමසාරිස්දැනුවත් කරන මෙන් ප්‍රධාන ලේකම්විසින් ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම් වෙත දන්වන ලදී.<br><br>සුපිරි වෙළෙඳසැල් වැනි ස්ථාන හරහා ද බලපත්‍ර ලබා දිය හැකි ක්‍රමවේදයක් සකස් කිරීම පිළිබඳව සොයා බලන ලෙස ද, වැඩිදුරටත් දන්වන ලදී. | ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය |
| 07. | පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් ඉදිරිපත් කරන ලද CM/WP/CMA/1/16 අංක හා 2019.01.09 දිනැති ලිපියේ සඳහන් නව යෝජනා | i. රජයේ ආයතන හා නිලධාරීන් සඳහා සන්නිවේදන පහසුකම් සැපයීම හා බිල්පත් නිරවුල් කිරීම මැයෙන් වන මුල්‍ය චක්‍රලේඛ 06/2015 නිකුත් කරන විටභාවිතා කරන ලද දුරකථන පහසුකම්වලට වඩා අන්තර්ජාල පහසුකම් භාවිතයට ගැනීම වර්තමානයේ ප්‍රචලිත වී ඇති බැවින්, එකී චක්‍රලේඛයේ දුරකථන දීමනාව සංශෝධනය කිරීම සම්බන්ධව<br>• අදාල චක්‍රලේඛය මුදල් අමාත්‍යාංශයෙන් නිකුත් කරන ලදුව පළාතටඅනුගත කර ගත් චක්‍රලේඛයක් බවත්, අදාල ඉල්ලීම මහා භාණ්ඩාගාරය වෙත යොමු කළ හැකි බවත්,නි.ප්‍ර.ලේ.(මුල්‍ය)විසින් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව, අදාල යෝජනාව මහා භාණ්ඩාගාරය වෙත යොමු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br><br>ii. ඇඟිලිසලකුණු යන්ත්‍රයට අදාල මාසික පැමිණීමේ වාර්තාව ITRDA වෙතින් ලබා දීම ප්‍රමාද වීම නිසා නිවාඩු ලේඛන යාවත්කාලීනකිරීම ප්‍රමාද වීම සිදු වන බැවින්, එකී වාර්තාව අදාල කාර්යාල වෙතින් ම ලබා ගැනීමට හෝ වෙනත් සුදුසු ක්‍රමවේදයක් සැකසීම<br>• Server කාමරය සකසා අවසන් වූ පසුඅදාල ආයතනය විසින්ම පැමිණීමේ වාර්තාව ලබා ගැනීමේක්‍රමවේදයක් සකසා ඇති බවත්, මාර්තු මුල් සතිය වන විට අදාල ක්‍රියාවලිය ආරම්භ කළ හැකි බවත්, තොරතුරුතාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂවිසින් ප්‍රකාශ කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය)<br><br>අධ්‍යක්ෂ, තොරතුරුතාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය |
| 08. | ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ පාසල් සතිය ප්‍රකාශයට පත් කිරීම | ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ පාසල් සතිය ප්‍රකාශයට පත් කිරීම සඳහාජනාධිපති ලේකම් විසින් යොමු කරන ලද PS/DSP/DPU/C/01/2019 චක්‍රලේඛ අංක හා 2019.01.09 දිනැති චක්‍රලේඛය පිළිබඳව ප්‍රධාන ලේකම් විසින් සාකච්ඡා කළ අතර, 2019.01.21-28 දක්වා සිදු කළ වැඩසටහන් පිළිබඳ ප්‍රගතිය ඡායාරූප ද සමඟඊළඟ ලේකම්වරුන්ගේ රැස්වීමට ඉදිරිපත් කරනලෙස ප්‍රධාන ලේකම්විසින් උපදෙස් ලබා දෙන ලදී. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>ලේකම්,සෞඛ්‍ය අමාත්‍යාංශය<br><br>ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| 09. | බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් යොමු කරන ලද WPC/PSC/ADM/07/03 (2019) අංක හා 2019.01.09 දිනැති ලිපියේ සඳහන් යෝජනා | i. චක්‍රලේඛපළාතට අදාල කර ගැනීම - ඒකාබද්ධ සේවා චක්‍රලේඛපළාතට අදාල කර ගැනීම සම්බන්ධ කමිටුව රැස් වී ඇති බවත්, කටයුතු කඩිනමින් සිදු වෙමින් පවතින බවත්, නි.ප්‍ර.ලේ.(පාලන) විසින් දන්වන ලදී.<br><br>ii. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම - ඉදිරිපත් කර ඇති පටිපාටියේසංශෝධන ඇති බැවින්, කඩිනමින් අඩුපාඩු සකස් කර ඉදිරිපත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී.<br><br>iii. තාක්ෂණසේවා ව්‍යවස්ථාවට අදාල බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි සකස් කිරීම හා පළාත් ආදායම් සේවා ව්‍යවස්ථාවරා.ප.ච. 06/2006 අනුව සකස් කිරීම - 2018.11.30 දින පැවති සාකච්ඡාවේ දී හඳුනාගත් ගැටළු 32 සම්බන්ධ මාර්තු මාසයේ පැවැත්වීමට නියමිත සාකච්ඡාවට පෙර ප්‍රගති සමාලෝචන රැස්වීමක් සූදානම් කර ගන්නා ලෙස ප්‍රධාන ලේකම් විසින් නි.ප්‍ර.ලේ. (පි/පු) හා රා.සේ.කො. ලේකම් වෙත උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)<br><br>ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 10. | "දිරිය හල" හා වෙසක් කාඩ් පත් අලෙවිය සම්බන්ධව | වෛද්‍ය ලංකා ජයසූරිය මහත්මිය විසින් පවත්වාගෙන යනු ලබන පදනම විසින් මහරගම අපේක්ෂා රෝහල සම්බන්ධ කර ගනිමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන බවත්, එහි ප්‍රතිලාභ ඍජුවම රෝගියාට හා පවුලේ ඥාතීන්ට ලැබෙන ව්‍යාපෘතියක් බවත්, ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.<br>"දිරියහල්"සෞඛ්‍ය අමාත්‍යාංශය හාසමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් පළමු මහලේ ස්ථාපිත කරන බවත්, ඒසඳහා අවශ්‍ය සහාය ලබා දීමට කාර්ය මණ්ඩලය දැනුවත් කරන ලෙසත්, වෙසක් මාසයේ දී පිළිකා රෝගීන් විසින් නිර්මාණය කළ වෙසක් කාඩ් පත් අලෙවි කිරීම සිදු කරන බැවින්, ඒ සඳහා ද අවශ්‍ය සහයෝගය ලබා දීමට කාර්ය මණ්ඩලය දැනුවත් කරන ලෙසත්, ප්‍රධානලේකම් විසින් දන්වන ලදී. | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය<br><br>සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු. |
| 11. | ග්‍රාම ශක්ති ප්‍රගති සමාලෝචනය | අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන්, ප්‍රධාන ලේකම් කාර්යාලය මඟින් සංවිධානය කරනු ලබන "ග්‍රාම ශක්ති ශ්‍රමදාන සතිය" 2019.02.15 සිට 28 දක්වා පැවැත්වෙන බවත්, ඊට සමගාමීව පැවැත්වෙන බස්නාහිර පළාත් ප්‍රගති සමාලෝචන රැස්වීම 2019.02.18 දින කොළඹ සහගම්පහදී පැවැත්වෙන බවත්, ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. එම 2018.02.18 දින පැවැත්වෙන රැස්වීම සඳහා සඳහාසියලුමඅමාත්‍යාංශ ලේකම්වරු, දෙපාර්තමේන්තු ප්‍රධානින්හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු පැමිණිය යුතු බවත්, ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී.<br>පළාත් පාලන ආයතනවල රැස්වීම් පෙබරවාරි 18ට පෙර අවසන් කර ගන්නා ලෙස ප්‍රධාන ලේකම් විසින් පළාත් පාලන ජ්‍යො. ස.ලේ. වෙත දන්වන ලදී.<br><br>එසේම, පෙබරවාරි 15-28 ග්‍රාම ශක්ති ශ්‍රමදාන සතිය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ග්‍රාම සංවර්ධන නිලධාරීන් දැනුවත් කරන ලෙසට වැඩිදුරටත් ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී. | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය<br><br>ලේකම්,ප්‍රවාහන අමාත්‍යාංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)<br><br>පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව |

| | | | |
|---|---|---|---|
| 12. | ජනාධිපති කාර්යාලය විසින් හඳුන්වා දී ඇති ව්‍යාපෘති 05 සම්බන්ධව | ජනාධිපති කාර්යාලය විසින් හඳුන්වා දී ඇති ව්‍යාපෘති 05 සම්බන්ධයෙන් අදාල චක්‍රලේඛවලඋපදෙස් ප්‍රකාරව කටයුතු කරන ලෙස අතිගරු ජනාධිපතිතුමා සමඟපැවති සාකච්ඡාවේ දී දැනුවත් කළ බවත්, අදාල ව්‍යාපෘති නිසි පරිදි ක්‍රියාත්මක කරන ලෙසත්, ප්‍රධාන ලේකම් විසින් සියලුම ලේකම්වරුන් වෙත දන්වන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුසහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 13. | අන්තර් පළාත් විෂය සම්බන්ධීකරණ සමුළුව මැයෙන් නි.ප්‍රලේ(පි/පු) විසින් යොමු කරන ලද CSWP/PTR/12-3/FI/3 අංක හා 2019.01.21 දිනැතිලිපියේ සඳහන් යෝජනා | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි/සිවිල්/විදුලි/ යාන්ත්‍රික සඳහාවෙනමසේවයක් ස්ථාපනය කිරීමට අදාලව යෝජිත සේවාව සඳහා සකස් කරන ලද නව සේවා ව්‍යවස්ථා කෙටුම්පත සඳහා 'අභ්‍යන්තරහා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය' විසින් නිරීක්ෂණ විමසා ඇති බවත්, ඒ සඳහා ඉංජිනේරු හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව එකඟ නමුත්, බ.ප.පළාත් පාලන අමාත්‍යාංශය එකඟ වී නොමැති බැවින්,බස්නාහිර පළාත ලෙස නිරීක්ෂණ ඉදිරිපත් කිරීමටනොහැකි වී ඇති බව නි.ප්‍ර.ලේ.(පි/පු)ප්‍රකාශ කරන ලදී.<br>ඒ සඳහා නි.ප්‍ර.ලේ(පි/පු), නි.ප්‍ර.ලේ(ඉංජිනේරු), වාරිමාර්ග, පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් හා ප්‍රධාන ලේකම් අතර සාකච්ඡාවක් 2019.01.25 ප.ව. 12.30ට සූදානම් කරන ලෙස නි.ප්‍ර.ලේ(පි/පු) වෙත දන්වන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 14. | දිසාපතිවරුන් හා ප්‍රධාන ලේකම්වරුන්ගේරුස්වීම | අමාත්‍යාංශ විෂය පථ වෙනස් වීම හේතුවෙන්'අභ්‍යන්තරහා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය' විසින් දිසාපතිවරුන් හා ප්‍රධාන ලේකම්වරුන්ගේරුස්වීම ඒකාබද්ධ කර ඇත. එබැවින්, දිස්ත්‍රික් ලේකම්වරු සමඟ සාකච්ඡා කළ යුතු කරුණු වේ නම්, එම සාකච්ඡාව පැවැත්වීමට පෙර ප්‍රධාන ලේකම් වෙත යොමු කරන ලෙස දැනුම් දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුසහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 15. | බස්නාහිර පළාතේ පළාත් සභාව පැවැත්වෙන දිනයන් වලදී අමාත්‍යාංශ ලේකම්වරුන්ගේසහනියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්ගේ සහභාගිත්වය | බස්නාහිර පළාතේ පළාත් සභාව පැවැත්වෙන දිනයන් වලදී අමාත්‍යාංශ ලේකම්වරුන්ගේසහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්ගේ පැමිණීම අනිවාර්ය බවත්, හදිසි අවස්ථාවල දී බැහැර යාමට අවශ්‍ය වේ නම්, ඒ සඳහා වගකිවයුතු නිලධාරියෙකු සහභාගී කරවන ලෙසත්, ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>එමෙන්ම, සභා න්‍යාය පත්‍රයට අදාලව යම් අමාත්‍යාංශයක්/දෙපාර්තමේන්තුවක් සම්බන්ධ කරුණක් ඇතුළත් කර ඇත්නම්, අනිවාර්යයෙන් මේ සඳහා අදාල නිලධාරීන් සහභාගී කරවීම ලේකම්වරුන්ගේ වගකීමක් වන බව ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුසහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 16. | පළාත් සභා ගොඩනැගිල්ලේ වාහන ගාල් කිරීම. | දීර්ඝ කාලයක් එකම ස්ථානයේ ගාල් කර ඇති වාහන පිළිබඳ ලේඛනය ප්‍රධාන ලේකම් විසින් ඉදිරිපත් කළ අතර, වහාම එම වාහන ඉවත් කර ගැනීමට කටයුතු කරන ලෙස දන්වන ලදී.<br>එසේම, වෙන් කර ඇති ස්ථානවල පමණක් වාහන ගාල් කරන ලෙසත්, ඒ සම්බන්ධව ආරක්ෂක අංශය විසින් ලබා දෙන උපදෙස් පිළිපදින ලෙසත්, ආරක්ෂක අංශ නිලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කරන ලෙසත්, ඒ සම්බන්ධයෙන් රියදුරන් සහ කාර්ය මණ්ඩලය දැනුවත් කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් වැඩිදුරටත් දන්වා සිටින ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුසහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |

| | | | |
|---|---|---|---|
| 17. | සභාව පැවැත්වෙන දිනයන්හි දී විදුලි සෝපාන පරිහරණය | සභාවපැවැත්වෙන දිනයන්හි දී විදුලි සෝපාන Basement වෙත අනිවාර්යයෙන් යා යුතු බවත්, අතරමැදහැරවීම් නොකළ යුතු බවත් ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.<br>එසේම, ඊළඟ සභා දින සිට විදුලිසෝපාන ක්‍රියාත්මක කිරීමසඳහා ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරියෙකු යොදවන ලෙසත්, සභාවට වෙන් කරන ලද සෝපානවල නම් කරන ලද නිලධාරීන් හැර අනෙකුත් නිලධාරීන්ගමන් නොකරන ලෙස කාර්ය මණ්ඩලය දැනුවත් කරන ලෙසත්, ප්‍රධාන ලේකම් විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුසහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 18. | නිවාඩු දිනයන්හි සේවයට වාර්තා කිරීම | නිවාඩු දිනයන්හිඅනුමැතියකින් තොරව සේවයටවාර්තා නොකරන ලෙස කාර්ය මණ්ඩලය දැනුවත් කරන ලෙසත්, මේ සම්බන්ධව ආරක්ෂක අංශය සමඟ රැස්වීමක් සූදානම් කරන ලෙසටත්, ප්‍රධාන ලේකම් විසින් නි.ප්‍ර.ලේ(පාලන) වෙත උපදෙස් ලබා දෙන ලදී.<br>එසේම, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ/ ගරුඅමාත්‍යවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය ද නිවාඩු දිනයන්හි සේවයට වාර්තා කරන්නේ නම්, ඒ බව ප්‍රධාන ලේකම් වෙත හා ආරක්ෂක අංශය වෙත පූර්ව දැනුම්දීමක් කරන ලෙස ගරු අමාත්‍යවරුන්ගේ පෞද්ගලික ලේකම්වරු දැනුවත් කරන ලෙසත්ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 19. | විදේශ නිවාඩු ඉල්ලුම් කිරීම | විදේශ නිවාඩු ඉල්ලුම් කිරීමේ දී පූර්ව අනුමැතිය ලබා ගැනීම සඳහා හඳුන්වා දුන් අයදුම්පත මේ වන විට අවලංගු කර ඇති බවත්, ඒ සම්බන්ධව ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බවත්, ආණ්ඩුකාර ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී<br>.<br>එසේම, දිවයිනෙන් බැහැර නිවාඩු ඉල්ලුම් කිරීමේ දී දින 14කට පෙර ඉල්ලීමට කටයුතු කරන ලෙස ආයතන ප්‍රධානීන් දැනුවත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | ආණ්ඩුකාර ලේකම්<br><br>සියලුම අමාත්‍යාංශ ලේකම්වරුසහ නියෝජ්‍ය ප්රධාන ලේකම්වරු |
| 20. | ගරු ආණ්ඩුකාරතුමා හා ගිණුම් කාරක සභාව වෙත ලිපි ඉදිරිපත් කිරීම | ගරු ආණ්ඩුකාරතුමා වෙත ලිපි ඉදිරිපත් කිරීමේ දී ප්‍රධාන ලේකම් හෝ අමාත්‍යාංශ ලේකම්වරුන් පමණක් අත්සන් කර ලිපි ඉදිරිපත් කරන ලෙස හා ප්‍රධාන ලේකම් වෙත ලිපි ඉදිරිපත් කිරීමේ දී නිසි ධූරාවලිය අනුව ලිපි ඉදිරිපත් කරන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා ආයතන ප්‍රධානීන් දැනුවත් කරන ලෙසප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br><br>ගිණුම් කාරක සභාව වෙත ලිපි ඉදිරිපත් කිරීමේ දී ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් පමණක් අත්සන් කර ලිපි ඉදිරිපත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරුසහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 21. | රජයේ වියදමින් ගරු මන්ත්‍රීවරුන්, ධුරධාරීන් හා මාණ්ඩලික නිලධාරීන්වෙත ලබා දී ඇති iPad හා iPhone වසර තුනකින් පසු එම ගරු මන්ත්‍රීවරුන් වෙතම ලබා දීම සම්බන්ධව | මේ සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් තීරණයක් ලබා දී තිබුණ ද,වසර 03කින් පසු අදාල භාණ්ඩයේ වටිනාකමින් 10%ක් ගෙවා ලබා ගැනීමටත්, වසර 01, 02 ආදී වශයෙන් අය කළ යුතු ප්‍රතිශතයන් සම්බන්ධ කෙටුම්පතක් සකසා ඉදිරිපත් කරන ලෙස නි.ප්‍ර.ලේ.(පාලන) වෙත ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

| | | | |
|---|---|---|---|
| 22. | නව පළාත් සභා ගොඩනැගිල්ලේ සියලු ආයතන සඳහා යතුරු පුවරු සැකසීම | නව පළාත් සභා ගොඩනැගිල්ලේ සියලු ආයතන සඳහා යතුරු පුවරු සාම්පලයක් සතියක් තුල ඉදිරිපත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් නි.ප්‍ර ලේ.(ඉංජිනේරු ) වෙත දන්වන ලදී.<br><br>පුවරු අවශ්‍යතාව ලබා ගන්නා ලෙස නි.ප්‍ර ලේ.(පාලන) වෙත උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු )<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

**මෙහි දී ප්‍රධාන ලේකම් විසින් සියලුම ලේකම්වරුන්ගෙන් සාකච්ඡා කිරීමට ඇති වෙනත් කරුණු පිළිබඳව විමසූ අතර, ලේකම්වරුන් විසින් තම අදහස් ඉදිරිපත් කරන ලදී.**

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත වැඩ බැලීම/රාජකාරි ආවරණය සඳහා අනුමැතිය ලබා ගැනීමට ලැබෙන ඉල්ලීම් සම්බන්ධව | බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත වැඩ බැලීම/රාජකාරි ආවරණය සඳහා අනුමැතිය ලබා ගැනීමට ලැබෙන ඉල්ලීම් ප්‍රමාද වී ලැබෙන බවත්, ප්‍රමාද වී ලැබෙන ඉල්ලීම් සඳහා කොමිෂන් සභාව අනුමැතිය ලබා නොදෙන බවත්,ලේකම් විසින් දන්වන ලදී. මෙම ඉල්ලීම් අදාල කාලය ඉක්මවීමට පෙර මාස 03ක් ඇතුළත ඉදිරිපත් කිරීමට ආයතන ප්‍රධානින් දැනුවත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් දන්වනලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 02. | බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන්සභාගොඩනැගිල්ලේතබා ඇති අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට අයත් භාණ්ඩ ඉවත් කර ගැනීම | බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ගොඩනැගිල්ලේ ඉඩකඩ සීමිත බැවින්, එහි කාමරයක තබා ඇති අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට අයත් භාණ්ඩ ඉවත් කර ගැනීමට කටයුතු කරන ලෙස අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ අධ්‍යක්ෂ දැනුවත් කරන ලෙස පළාත් පාලන අමාත්‍යාංශලේකම් වෙත ප්‍රධාන ලේකම් විසින්දන්වනලදී. | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය |
| 03. | අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේබෙදාවෙන් කිරීම්(Partition) කඩිනමින් අවසන් කිරීම | නව ගොඩනැගිල්ලේ ස්ථාපිත අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේබෙදා වෙන් කිරීම්(Partition) 2019.02.05 දිනට පෙර අවසන් කරන ලෙසටත්, කඩිනමින්විශේෂ අමුත්තන්ගේ ආපන ශාලාවෙන් ඉවත් වන ලෙසටත්, අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ අධ්‍යක්ෂ වෙත දන්වා ලිපියක් යොමු කරන ලෙස නි.ප්‍ර.ලේ(පාලන) හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත දන්වන ලදී. | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

| | | | |
|---|---|---|---|
| 04. | කාර්ය මණ්ඩල පුරප්පාඩු පිළිබඳ වාර්තා අදාළ කාර්තුවේ දි ඉදිරිපත් නොකිරීම සම්බන්ධව | කාර්ය මණ්ඩල පුරප්පාඩු පිළිබඳ වාර්තා අදාළ කාර්තුවේ දි ඉදිරිපත් නොකිරීම නිසා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විමසීමේ දී වාර්තා කිරීම ගැටළු සහගත බව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්(බ.ප.) දන්වන ලදී.<br>ඒ සඳහා ප්‍රධාන ලේකම්/නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පිරිස් හා පුහුණු) සාකච්ඡා කර අදාළ ආයතන වෙත නිශ්චිත දිනයක් ලබා දීමට කටයුතු කරන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) වෙත දන්වන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 05. | බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තනතුරු පුරප්පාඩු සම්බන්ධව | බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කළමනාකරණ සහකාරවරුන් 32 ක් සේවයේ යෙදුන ද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කර ඇත්තේ තනතුරු 30 ක් පමණක් වන බවත් ඉතිරි තනතුරු 02 අනුමත කර ගත යුතු බවත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් (බ.ප.) විසින් ප්‍රකාශ කරන ලද බැවින්,ඉල්ලීම නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු ) වෙත යොමු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී.<br><br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරියෙකුගේ සේවය නිත්‍ය වශයෙන් ලබා දෙන ලෙස පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්(බ.ප.) විසින් ඉල්ලා සිටි බැවින්, එමනිලධාරියා නිත්‍ය වශයෙන් අනුයුක්ත කරන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) වෙත ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පිරිස් හා පුහුණු )<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 06. | මූල්‍යමය ප්‍රතිපාදන සම්බන්ධ අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීමේ දී නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) ගේ නිර්දේශ හා අනෙකුත් අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා අදාල නිලධාරීන්ගේ නිර්දේශ ලබා ගැනීම. | අමාත්‍යාංශ ලේකම්වරු, දෙපාර්තමේන්තුප්‍රධානින් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු විසින් මූල්‍යමය ප්‍රතිපාදන සම්බන්ධ අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීමේ දී නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) ගේ නිරීක්ෂණ අනිවාර්යයෙන් ලබා ගන්නා ලෙසත්, කැබිනට් පත්‍රිකා සඳහා නිරීක්ෂණ ලබා දීමේ දී අනිවාර්යයෙන් එම සංදේශයට අදාල පරිදි නිරීක්ෂණ ඉදිරිපත් කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් දන්වන ලද අතර,වක්‍රලේඛ පළාතට අදාළ කර ගැනීමේ කමිටුව සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) ද ඇතුළත් කර ගැනීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 07. | නව ගොඩනැඟිල්ලේ නඩත්තු ඒකකය | නව ගොඩනැඟිල්ලේ නඩත්තු ඒකකය ඉංජිනේරු තලංගම මහතාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කර ඇති අතර,ඒ සඳහා සෑම ආයතනයකින්ම සම්බන්ධීකරණ නිලධාරියකු නම් කර එවන ලෙසත්,ඉදිරියේ දී මෙම ඒකකය විසින් අදාළ නිලධාරියා පමණක් සම්බන්ධ කර ගනිමින් කටයුතු කරන බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් දන්වන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 08. | පළාත් සභා නිලධාරීන්ගේ දරුවන් සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක්හා වෙනම පාසල් දෙකක්ආරම්භ කිරීම | දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් හා කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ දරුවන් සඳහා වෙන වෙනම බාලක සහ බාලිකා පාසල් දෙකක් ආරම්භ කිරීමේ වැදගත්කමනි.ප්‍ර.ලේ. (ඉංජිනේරු) විසින් ප්‍රකාශ කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |

| | | | |
|---|---|---|---|
| 09. | නව ගොඩනැගිල්ල සඳහා ප්‍රථමාධාර ඒකකයක් ආරම්භ කිරීම. | පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ යෝජනාව පරිදි ආරම්භ කිරීමට නියමිත ප්‍රථමාධාර ඒකකය සඳහා පළමු මහලේ ස්ථානයක් වෙන් කරන බවත් නොමිලේ ප්‍රතිකාර ලබා ගැනීම සඳහා නිලධාරීන්ට වෛද්‍යවරයකුගේ සේවය ලබා දීමට සෞඛ්‍ය ලේකම් එකඟ බවත් ප්‍රධාන ලේකම් වෙත දන්වන ලදී. | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය<br><br>ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 10. | පළාත් දීමනා කමිටුවේ යෝජනා ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කිරීම | පළාත් දීමනා කමිටුව මඟින් අනුමත නොකරන දීමනා පිළිබඳ තොරතුරු ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් නොකරන ලෙසත් අනුමත කරන දීමනා පමණක් ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කරන ලෙසත් ආණ්ඩුකාර ලේකම් විසින් දන්වන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන) (දීමනාකමිටු සභාපති) |
| 11. | ගරු ආණ්ඩුකාරතුමා සමඟ පැවැත්වෙන සාකච්ඡාව | 2019.01.25 දින ගරු ආණ්ඩුකාරතුමා සමඟ පැවැත්වෙන සාකච්ඡාව සඳහා අමාත්‍යාංශ ලේකම්වරු,නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහභාගීවන ලෙස ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් |
| 12. | ProjectManagement System (සැලසුම් අංශය) | මෙම වැඩසටහන, පළාත් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධනව්‍යාපෘති/වැඩසටහන් සම්බන්ධ තොරතුරු ඇතුළත් කිරීම,යාවත්කාලීන කිරීම,ප්‍රගති සමාලෝචනය ආදී කරුණු සම්බන්ධ මෘදුකාංගයක් වන අතර, 2019.03.01 සිට ක්‍රියාත්මක කිරීමට ආයතන ප්‍රධානීන් වෙත චක්‍රලේඛයක් නිකුත් කිරීමටත් පුහුණු වැඩසටහන් අඛණ්ඩව පවත්වන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) වෙත දන්වන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |

ඩබ්ලිව්.එම්.දයාවතී,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධානලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.